**ශීර්ෂ 121 - රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2013 වර්ෂය**

---

මෙම වාර්තාව කොටස් දෙකකින් සමන්විත වේ.

1 කොටස - අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව.

2 කොටස - එක් එක් ශීර්ෂයන්ට අදාල විස්තරාත්මක වාර්තාව

**1 කොටස**

**රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව**

---

**1. අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු**

| ශීර්ෂය | දෙපාර්තමේන්තුවේ නම |
|---|---|
| 253 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව |
| 254 | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව |

**2 ගිණුම්**

**2.1. විසර්ජන ගිණුම්**

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම්**

අමාත්‍යාංශය හා අමතයාංශය යටතේ වූ දෙපාර්තමේන්තු 02 ක් සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.147,170,999,859 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.141,521,589,213 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය හා එක් එක් දෙපාර්තමේන්තුවල ශුද්ධ ප්‍රතිපාදනගෙන් ඉතිරිවීම් රු.18,365,728 ක සිට රු.5,376,811,532 ක් දක්වා වූ පරාසයක ප්‍රමාණයකින් හෙවත් මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 2.15 සිට සියයට 22.47 ක් දක්වා පරාසයක පැවතින. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | 2013 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | | රු. | රු. | රු. | |
| 121 | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 1,131,627,586 | 877,394,200 | 254,233,386 | 22.47 |
| 253 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | 145,185,872,807 | 139,809,061,275 | 5,376,811,532 | 03.70 |
| 254 | රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව | 853,499,466 | 835,133,738 | 18,365,728 | 02.15 |
| | **එකතුව** | **147,170,999,859** | **141,521,589,213** | **5,649,410,646** | **03.84** |

## 2.2. ආදායම් ගිණුම්

### ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම්

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු 02 ක් විසින් 2013 වර්ෂයේදී ආදායම් සංකේත 05 ක් සඳහා රු.මිලියන 14,228 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර ආදයම් ලෙස රු.මිලියන 16,500 ක් රැස්කර තිබුණි. ඒ අනුව ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 92.67 සිට සියයට 4,909.68 දක්වා පරාසයක ප්‍රමාණයකින් ආදායම් රැස්කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් ගණන්දීමේ නිලධාරි | ආදායම් සංකේතය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | ඇස්තමේන්තුගත ආදායම ඉක්මවීම/ (ඌනතාවය) | ඉක්මවීම/ (ඌනතාවය) ඇස්තමේන්තු ගත ආදායමේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | |
| ලේකම්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 10:03:07:99 | 133,389,000 | 141,789,131 | 8,400,131 | 106.29 |
| අධ්‍යක්ෂ ජනරාල්, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | 20:04:01:00 | 8,528,000,000 | 8,866,646,032 | 338,646,032 | 103.97 |
| අධ්‍යක්ෂ ජනරාල්, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | 20:04:02:00 | 4,340,000,000 | 6,278,095,915 | 1,938,095,915 | 144.66 |
| රෙජිස්ට්‍රාර් ජනරාල්, රජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | 10:03:02:00 | 1,600,000 | 78,555,000 | 76,955,000 | 4909.68 |

| | | | | | |
|---|---|---|---|---|---|
| රෙජිස්ට්‍රාර් ජනරාල්, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව. | 10:03:07:02 | 1,225,000,000 | 1,135,204,321 | (89,795,679) | (92.67) |
| **එකතුව** | | **14,227,989,000** | **16,500,290,399** | **2,272,301,399** | **15.97** |

## 2.3. අත්තිකාරම් ගිණුම්

### 2.3.1 රජයේ නිළධාරින්ට අත්තිකාරම් ගිණුම්

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු 02 ක් වෙත රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු පහත සඳහන් සීමාවන් පිළිපැද තිබුණි.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 12101 | 29,000,000 | 24,070,567 | 14,000,000 | 16,646,031 | 100,000,000 | 73,464,595 |
| 25301 | 30,000,000 | 29,995,206 | 16,000,000 | 19,377,089 | 12,000,000 | 91,983,347 |
| 25401 | 64,000,000 | 50,512,239 | 35,000,000 | 39,044,401 | 200,000,000 | 153,830,841 |

## 2.4. අග්‍රිම හා පොදු තැන්පත් ගිණුම්

### 2.4.1 අග්‍රිම ගිණුම්

අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවක 2013 දෙසැම්බර් 31 දින වන විට අග්‍රිම ගිණුම්වල රු.535,683 ක් වූ හර ශේෂ පැවතුණි. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | 2013 දෙසැම්බර් 31 දිනට හර ශේෂය |
|---|---|
| | රු. |
| රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 534,975 |
| විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | 708 |
| **එකතුව** | **535,683** |

## 2.4.2 පොදු තැන්පත් ගිණුම්

2013 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු 02 ක පොදු තැන්පත් ගිණුම්වල ශේෂවල එකතුව රු.13,741,648 ක් වූ අතර ඒ පිළිබඳව විස්තර පහත දැක්වේ

| අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | ගිණුම් අංකය | 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු. |
| රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 6000/0000/00/0015/0034/000 | 4,165,455 |
| විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0133/000 | 9,464,427 |
| රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0134/000 | 111,766 |
| **එකතුව** | | **13,741,648** |

**2 කොටස**

**එක් එක් ශීර්ෂයට අදාල විස්තරාත්මක වාර්තාව**

## 1. ශීර්ෂය 121 - රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

### 1.1 විගණන විෂය පථය

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා ආදායම් ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත

වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 දෙසැම්බර් 04 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම, අදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 1.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.11 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

#### (අ) අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයයන් 07 ක් සඳහා සළසා තිබුණු රු.47,440,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ii) වැය විෂයයන් 06 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 12 සිට සියයට 98 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(iii) වැය විෂයයන් 15 ක් වෙනුවෙන් රු.890,793 ක බැරකම් විසර්ජන ගිණුමේ අඩුවෙන් දක්වා තිබුණි.

**(ආ) අග්‍රිම ගිණුම**

**--------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව කාර්යය නිමකළ වහාම ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කළ යුත් වුවත්, අවස්ථා 24 කදී අදාල කාර්යය නිමවී දින 31 සිට දින 107 ක් දක්වා වූ කාල පරාසයක ප්‍රමාදයකින් පසුව අතුරු අග්‍රිමය නිරවුල් කර තිබුණි.

(ii) මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව එක් මාණ්ඩලික නිලධාරියෙකු වෙත එක් වරකදී නිකුත් කළ හැකි උපරිම තත්කාර්ය අතුරු අග්‍රිමය රු.20,000 ක් වුවත්, එම රෙගුලාසිවලට පටහැනිව දින 04 ක් තුළ අවස්ථා 08 කදී නිලධාරීන් දෙදෙනකු වෙත රු.20,000 ක් ඉක්මවූ එකතුව රු.138,800 ක තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.

(iii) අවස්ථා 06 කදී රු.78,271 ක්වූ තත්කාර්ය අතුරු අග්‍රිම ලබා ගෙන දින 07 සිට දින 31 ක් දක්වා වූ කාල පරාසයක් තුළ අත රඳවා ගෙන පසුව මුළු අග්‍රිමයම මුදලින් පියවා තිබුණි. මේ නිසා රජයේ මුදල් තාවකාලිකව වංචා කිරීමට ඉඩ ප්‍රස්ථා විවර කර තිබුණි.

(iv) මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව තත්කාර්ය අතුරු අග්‍රිම මාණ්ඩලික නිලධාරීන් වෙත පමණක් නිකුත් කළ යුතු වුවත්, ඊට පටහැනිව අවස්ථා දෙකකදී එකතුව රු.210,000 ක් අමාත්‍යාංශයෙන් පරිබාහිර පුද්ගලයන් වෙත නිකුත් කර දින 12 ක් හා දින 57 ක් රජයේ මුදල් එම පුද්ගලයන් සන්තකයේ රඳවා ගැනීමට අමාත්‍යාංශය කටයුතු කර තිබුණි.

**(ඇ) ආදායම් ගිණුම**

**-----------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අමාත්‍යාංශය විසින් 2013 වර්ෂය සඳහා අංක 10.03.07.99 දරන ආදායම් සංකේතය සඳහා එකතුව රු.මිලියන 133.4 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 141.8 ක ආදායමක් රැස්කර

තිබුණි. එනම් සංශෝධිත ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 106.3 ප්‍රතිශතයකින් ආදායම් රැස්කර තිබුණි.

(ii) එම ආදායම් සංකේතයට අදාලව ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2012 වර්ෂයේ දී රැස්කළ ආදායම රු.17,169,593 ක් වී තිබුණු අතර 2013 වර්ෂය සඳහා රු.10,000,000 ක් ලෙස ආදායම ඇස්තමේන්තු කර තිබුණි. පසුව එය රු.20,000,000 දක්වා සංශෝධනය කර තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසානයේදී රු.25,585,890 ක ආදායමක් රැස්කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී රැස්කළ හැකි ආදායම නිවැරදි ලෙස පුරෝකථනය කිරිමට අපොහොසත් වී තිබුණි.

(iii) 1997 ජනවාරි 13 දිනැති අංක 97/02 ප්‍රාදේශීය පරිපාලන චක්‍රලේඛයේ 02 ඡේදයට අනුව හැකි සෑම විටම වාර්ෂික ආදායම් සහතික පමණක් නිකුත් කිරීම යෝග්‍ය බව සඳහන් කර තිබියදී එය නොසළකා ත්‍රිකුණාමලය,පොලොන්නරුව සහ වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් මාසික ආදායම් සහතික නිකුත් කර තිබුණි.

(iv) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික්ක 07 ක් විසින් උපයන ලද ආදායම් අඩුවී තිබුණු අතර ඉන් අම්පාර, මඩකලපුව, නුවරඑළිය සහ පුත්තලම යන දිස්ත්‍රික්කයන්හි ආදායම් අඩුවීම පිළිවෙලින් සියයට 38, සියයට 29, සියයට 16, හා සියයට 11 ක් වී තිබුණි.

**(ඈ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 12101 දරන අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුවෙන් රු.580,298 ක්වූ හිඟහිටි ශේෂ අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත්වී තිබුණි.

## 1.4 වත්කම් කළමනාකරණය

**(අ) පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම**

මුදල් අමාත්‍යාංශය වෙත අයිතිය පැවරී තිබුණු නිසාන් සනී වර්ගයේ මෝටර් රථය රු.275,000 ක වටිනාකමකට 2003 මැයි 28 දින බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

විසින් මිලදී ගෙන, 2011 ජූලි 21 දින රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත පරිහරණය සඳහා භාර දී තිබුණු නමුත්, 2014 ඔක්තෝබර් 30 දින තෙක්ම එහි අයිතිය අමාත්‍යාංශය වෙත පවරා ගෙන නොතිබුණි.

**(ආ) බේරුම් නොකළ බැරකම්**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අමාත්‍යාංශය විසින් 2013 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු. 33,196,700 ක් වූ අතර, එම ශේෂ වර්ෂයකට වඩා අඩු කාලයකට අදාල ඒවා විය.

(ii) ඉහත (i) හි සඳහන් ශේෂයන්ට අමතරව, වර්ෂයේ අවසාන දිනට බාහිර කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවිය යුතු වූ බැඳීම් වටිනාකම රු.2,589,489 ක් වී තිබුණි.

## 1.5 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| මුදල් රෙගුලාසි 1645(අ) | පොදු 267 ආකෘතිය අනුව පවත්වා ගත යුතු වාහන ලොග් සටහන් පොත් යාවත්කාලීන කර නොතිබුණි. |
| **(ආ) ජනාධිපති ලේකම් කාර්යාලයේ චක්‍රලේඛ** | |
| 2010 මැයි 14 දිනැති අංක CA/1/171දරන චක්‍රලේඛයේ 3.1 හා 3.2 ඡේද | අමාත්‍යවරයෙකු සඳහා උපරිම වශයෙන් නිල වාහන 03 ක් ලබා දිය යුතු වුවත්, ගරු අමාත්‍යවරයාගේ පරිහරණය සඳහා වාහන 05 ක් ලබා දී තිබුණි. එසේ අනුමත සීමාව ඉක්මවා වාහන |

| | |
|---|---|
| | ලබාදිම පිළිබඳව මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම් වෙතද දැනුම් දී නොතිබුණි. |

**(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

| | |
|---|---|
| (i) 1992 අගෝස්තු 19 දිනැති අංක 26/92 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02 හා 03 ඡේදයන් | සංචිත වාහන 03 ක රාජ්‍ය ලාංඡනය හා අමාත්‍යාංශයේ නම යොදා නොතිබුණි. |
| (ii) 2012 ජූනි 25 දිනැති 01/2012 දරන ඒකාබද්ධ සේවා චක්‍රලේඛයේ 03 ඡේදය හා වාර්ෂික ස්ථාන මාරු පටිපාටියේ 3.1 ඡේදය | වර්ෂ 02 කට අඩු කාලයක් පමණක් අමාත්‍යාශයේ සේවය කරන ලද රියදුරන් 14 දෙනෙකු වෙත අමාත්‍යාංශය විසින් ස්ථාන මාරු ලබා දී තිබුණි |

## 1.6 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන් පිළිබඳව නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

(i) 2006 වර්ෂයේදී නිවාස 1,452 කින් යුතු නිවාස සංකීර්ණයක් ඉදිකිරීම සඳහා කැප්පෙටිපොල මාවත - යෝජිත නිවාස සංකීර්ණ ව්‍යාපෘතිය අරඹා තිබුණු අතර , 2010 හා 2011 වර්ෂ දෙක තුළ නාගරික සංවර්ධන අධිකාරිය, මධ්‍යම ඉංජිනේරුමය කටයුතු පිළිබඳ උපදේශක කාර්යාංශය සහ ගොඩනැගිලි දෙපාර්තමේන්තුව යන ආයතන වෙත රු.5,019,262 ක් ගෙවා තිබුණි. කෙසේ නමුත් එම ව්‍යාපෘතියේ කටයුතු සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිම කර නොතිබුණි.

(ii) මහනුවර කුණ්ඩසාලේ නිවාස 696 ක් ඉදිකිරීම සඳහා රු.2,728,828,261 ක ඇස්තමේන්තුගත පිරිවැයක් සහිතව 2010 අගෝස්තු මාසයේදී ආරම්භ කරන ලද ව්‍යාපෘතියේ කටයුතු 2014 නොවැම්බර් 27 දින වන විටත් නිම කර නොතිබුණි.

(iii) ගාල්ල හබරාදුව නිවාස 576 ක් සහ වැකුණගොඩ නිවාස 512 ක් ඇතුළුව එකතුව නිවාස 1,088 ක් ඉදිකිරීම සඳහා 2003 වර්ෂයේදී අමාත්‍යාංශය, තවත් රාජ්‍ය හා පෞද්ගලික

ආයතන දෙකක් සමඟ ත්‍රෛපාර්ශවීය ගිවිසුමකට එළඹ තිබුණු අතර මෙම නිවාස ව්‍යාපෘතිය 2010 අප්‍රේල් මාසයේදී අවසන් කිරීමට නියමිතව තිබුණත්, හබරාදූව නිවාස ව්‍යාපෘතිය සඳහා හබරාදූව ප්‍රාදේශීය සභාවෙන් ලබා ගත යුතු අනුකූලතා සහතිකය (COC සහතිකය) 2014 ඔක්තෝබර් 31 දින වන විටත් ලබා ගෙන නොතිබුණි. ඒ අනුව ඉහත ව්‍යාපෘති දෙකෙන් කිසිදු නිවසක් ප්‍රතිලාභීන් වෙත අලෙවි කර නොතිබුණි.

(iv) මාණ්ඩලික නිලධාරී නිවාස 16 ක් සහ තනිකඩව පදිංචිය සඳහා කාමර 48 කින් යුතු මහල් 09 ක ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා රු.114,300,000 ක ඇස්තමේන්තුගත පිරිවැයක් සහිතව කොළඹ ගෝතමී පාරේ නිවාස ව්‍යාපෘතිය 2001 ඔක්තෝබර් මාසයේ ආරම්භ කිරීමට නියමිතව තිබුණි. එම ගොඩනැගිල්ල ඉදිකිරීම 2014 නොවැම්බර් මාසය වන විටත් ආරම්භ කර නොතිබුණි.

## 1.7 කාර්යසාධනය

2013 වර්ෂයේ අමාත්‍යාංශයේ කාර්යසාධනය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණ විය.

### (අ) ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්

අමාත්‍යාංශය විසින් ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු කර නොතිබූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

| අංශය | ක්ෂේත්‍රය | කාර්යය | නිමකළ ප්‍රතිශතය |
|---|---|---|---|
| අභ්‍යන්තර පාලන අංශය | විදුලි සෝපානයක් සවිකිරීම | ලංසු ලියකියවිලි අනුමත කිරීම | නැත |
| | පුරප්පාඩු හඳුනාගැනීම හා ඒවා පිරවීම | පුරප්පාඩු පිරවීම | නැත |

| | | | |
|---|---|---|---|
| මූල්‍ය අංශය | පරිපාලන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම | නව සෝපාන 02 ක් සවි කිරීම 4 වන මහලේ ඉඩකඩ ඒකීය ලෙස සංවර්ධනය කිරීම | නැත |
| ඉංජිනේරු අංශය | තරඟකාරී හා විනිවිද භාවයෙන් යුතු බඳවා ගැනීමේ පටිපාටියක් අනුගමනය කිරීමේ අරමුණ ඇතිව, කුසලතා අනුපිළිවෙල මත බඳවා ගැනීම් සඳහා විභාග පැවැත්වීම හා ඒ අනුව බඳවා ගැනීම් සිදු කිරීම. | පුරප්පාඩු පවතින ආයතනවලට නිලධාරීන් අනුයුක්ත කිරීම | නැත |
| සංවර්ධන, පර්යේෂණ හා නඩත්තු අංශය | සමුළු නිවාස වලට අදාලව අළුත්වැඩියා | අළුත්වැඩියා සිදුකළ නිවාස හා ඒ වෙනුවෙන් වැය කළ ප්‍රතිපාදන පිළිබඳ දත්ත පද්ධතියන් පවත්නා ගැනිම | 31 |
| ස්වදේශ කටයුතු අංශය | (i) විමධ්‍යගත පරිපාලනය සඳහා පුහුණු ක්‍රමෝපායයන් හඳුන්වාදීම | දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමේ පුහුණු පහසුකම් දියුණු කිරීම. | 20 |
| | | පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමේ පුහුණු ඒකක ශක්තිමත් කිරීම | 0 |
| | (ii) කාර්යාල වෙත එන මහජනතාවට නිශ්චිත සේවා පහසුකම් ඉටු කිරීම | කාර්යාල සඳහා නිශ්චිත සේවා පහසුකම් හඳුනා ගැනීම | 20 |
| | (iii) තොරතුරු තාක්ෂණය යොදා ගනිමින් දිස්ත්‍රික් පාලන, ප්‍රාදේශීය පාලන ආයතන පද්ධති ජාලගත කිරීම | අවශ්‍ය යටිතල පහසුකම් හඳුනා ගැනීම හා සැපයීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම. | 20 |
| | (iv) ප්‍රාදේශීය ලේකම් | කළමනාකරණ තරඟයේ ත්‍යාග ප්‍රදානෝත්සවයට අදාල කටයුතු | 0 |

| | | | |
|---|---|---|---|
| | කාර්යාල හා ග්‍රාම නිලධාරි කාර්යාල කළමනාකරණ තරහය | | |
| තොරතුරු තාක්ෂණ අංශය | තොරතුරු තාක්ෂණය සපයනු ලබන සේවා ප්‍රමාණය | රජයේ නිලධාරීන්ට අන්තර්ජාලය ඔස්සේ සංචාරක බංගලා සහ නිවාඩු නිකේතන වෙන් කරවා ගැනීමට ක්‍රමවේදයන් සකස් කිරීම | 10 |

**1.8 අවිධිමත් ගනුදෙනු**

**----------------------**

**රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම**

**-------------------------------------------------------------------**

අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේ පිටත වැසිකිලිය සහ අනිකුත් අළුත්වැඩියා කටයුතු ඉටුකිරීමේ කොන්ත්‍රාත්තුවේ ප්‍රමාණ බිල්පතෙහි සඳහන් රු.505,880 ක් වටිනා අයිතමයන් වර්ග 10 ක් වෙනුවට, ඊට වඩා ප්‍රමිතියෙන් අඩු අයිතමයන් සවිකර තිබුණි.

**1.9 අනාර්ථික ගනුදෙනු**

**--------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනුවක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

දුර බැහැර සිට රාජකාරියට පැමිණෙන අමාත්‍යාංශ නිලධාරීන් හට දුම්රිය ස්ථානය වෙත ප්‍රවාහන පහසුකම් සැපයීමේ මූලික පරමාර්ථයෙන් 2013 ජූලි 29 දින අමාත්‍යාංශය විසින් රු.මිලියන 5.5 කට බස් රථයක් මිලදී ගෙන තිබුණි. එම බස් රථය මිලදී ගත් දින සිට වර්ෂයක් ගතවීමට මත්තෙන් වරින් වර ගියර් පද්ධතිය හා ක්ලච් පද්ධතිය ක්‍රියා විරහිත වීම නිසා අළුත්වැඩියා කිරීම සිදු වීම නිසා සැලකිය යුතු කාලයක් බස් රථය ධාවනයෙන් ඉවත් කර තිබුණි. භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වලට අමතරව 2014 නොවැම්බර් 10 දින වන විට නැවතත් වාහනය අළුත්වැඩියාවන් සඳහා ගරාජය වෙත භාර දී තිබුණු අතර රථයේ වහලය මුළුමනින්ම අළුත්වැඩියා කළ යුතු බව විගණනයේදී නිරීක්ෂණය විය. වරින්වර අළුත්වැඩියා කිරීම සඳහා බස්රථය ධාවනය නොකිරීම නිසා බස් රථය මිලදී ගැනීමේ පරමාර්ථය ඉටු කිරීමට අපොහොසත් වී තිබුණි.

## 1.10 කළමනාකරණ දුර්වලතා

-------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) අමාත්‍යාංශය සතු මිට්සුබිෂී ජීප් රථය රු.900,000 කට තක්සේරු කර ඒ සඳහා පිළිවෙලින් රු.1,467,386 ක උපරිම මිලක් සහ රු.1,267,500 ක දෙවැනි උපරිම මිලක් සහිතව ලංසුකරුවන් දෙදෙනකු විසින් ලංසු ඉදිරිපත් කර තිබුණද, වාහනයේ මුල් ලියාපදිංචි සහතික නොතිබීම , වාහනය පැරණි වීම හා අබලන් තත්ත්වයේ පැවතීම ආදි හේතුන් නිසා ලංසුකරුවන් විසින් වාහනය මිලදී ගැනීම ප්‍රතික්ෂේප කර තිබුණි.

(ආ) මිට්සුබිෂී පෙජෙරෝ රථය අමාත්‍යාංශයේ වාහන වෙන්දේසි කිරීමකට හෝ වෙනත් අයුරකින් අපහරණය නොකොට, විශ්‍රාම ලබා ගිය නිලධාරියකු වෙත පවරා දීම සඳහා, වසර 03 ක පමණ කාලයක් පරිහරණයට යොදා නොගෙන අමාත්‍යාංශ පරිශ්‍රයේ ගාල්කොට තිබුණි.

(ඇ) විවිධ පාර්ශවයන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු ශේෂවල වටිනාකම රු.48,226,989 ක් වූ අතර එම ශේෂ වලින් එකතුව රු.21,335,170 ක් වර්ෂ 05 කට අඩු කාලයක්ද, එකතුව රු.26,891,819 ක ශේෂ වර්ෂ 05 කට වැඩි කාලයක සිට පැවැත එමින් තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

.

(i) ඉහත දැක්වෙන ශේෂයන්ට අදාලව රු.40,872,000 ක් වූ හිඟ ගෙවල් කුලී වටිනාකමක් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් අයවිය යුතුව තිබුණි.

(ii) පදිංචිකරුවන් 15 දෙනෙකුගෙන් හිඟ ගෙවල්කුලී වශයෙන් එකතුව රු.6,326,890 ක මුදලක් දීර්ඝ කාලයක සිට හිඟහිටව පැවැතුණි.

(iii) එක් නිලධාරීයෙකුගෙන් 2006 වර්ෂයට පෙර සිට අයවිය යුතුව තිබෙන රු.343,928 ක ශේෂයක් ඔහු විදේශ ගත වීම නිසා අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඈ) අමාත්‍යාංශයට අදාල විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ජේද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පරීක්ෂා කිරීමෙන් අනතුරුව මතු වූ කරුණු

සම්බන්ධයෙන් 2010 ඔක්තෝබර් 19 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිර්දේශ, බලධාරීන් විසින් ක්‍රියාත්මක කිරීමේදී මන්දගාමී ස්වරූපයක් පෙන්නුම් කෙරිණි. විස්තර පහත දැක්වේ.

| | යොමුගත විෂයය | සභාවේ නිර්දේශය | ලේකම්වරයාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | මාලිගාවත්ත මහ ලේකම් කාර්යාල පරිශ්‍රයේ ගොඩනැගිලිවලින් රු.මිලියන **246** ක නිවාස කුලී අය නොකිරීම | නිල නිවාස කුලී ඉක්මනින් අයකර ගැනීමටත් නඩත්තුව සඳහා එම ආයතන වෙතම ගොඩනැගිලි භාරදීමටත් කටයුතු කල යුතුය. | 2013 දෙසැම්බර් මාසය වන විට පැවති හිඟ කුලිය රු.මිලියන 246.6 ක් වී තිබුණු අතර, 2014 නොවැම්බර් 26 දින වන විට ඉන් රු.මිලියන 167 ක් අමාත්‍යාංශ ලේකම් විසින් නිරවුල් කර ගෙන තිබුණි. |
| (ii) | අග්‍රහාර රක්ෂණ ක්‍රමය සංශෝධනය කිරීම යටතේ ණය සුරකුම් රක්ෂණාවරණය ඇපයට තබා ණය ලබාගත් නිලධාරියෙකු සේවය හැර ගිය විටක හෝ සේවයෙන් පහ කරනු ලැබූ විට රක්ෂණාවරණය යටතේ රක්ෂණ ආවරණය ලබාගත නොහැකි වීම. | ණය පැහැර හරින නිලධාරීන්ට අදාල ණය මුදල අග්‍රහාර රක්ෂණ භාර අරමුදලින් අයකර ගැනීමට අවශ්‍ය පියවර ගැනීමට අදාල පාර්ශවයන් සමග සාකච්ඡා කරන ලෙස දෙන ලද නියෝගය | අග්‍රහාර රක්ෂණය සඳහා ඇපයට තබා ගන්නා ලද ණය මුදල්, නිලධාරියෙකු සේවය හැර ගිය විටක හෝ සේවයෙන් පහ කරනු ලැබූ විට අග්‍රහාර රක්ෂණ භාර අරමුදලින් අය කර ගැනීමට විධි විධාන ඇතුළත් කරමින් මේ වන විට චක්‍රලේඛයක් නිකුත් කිරීම සඳහා කෙටුම්පත් තිබුණි. |

## 1.11 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 74 | 63 | 12 | 01 |
| (ii) | තෘතියික මට්ටම | 18 | 14 | 04 | - |
| (iii) | ද්විතියික මට්ටම | 493 | 396 | 171 | 74 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 216 | 171 | 45 | - |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 01 | 01 | - | - |
| | එකතුව | **802** | **645** | **232** | **75** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

ගණකාධිකාරී සේවයේ අනුමත තනතුරු සංඛ්‍යාව 03 ක් වුවද, තථ්‍ය සේවක සංඛ්‍යාව 04ක් විය. එසේම සංවර්ධන නිලධාරී සේවයේ අනුමත තනතුරු සංඛ්‍යාව 25 ක් වුවද, තථ්‍ය සේවක සංඛ්‍යාව 99 ක් වී තිබුණි. අතිරික්ත තනතුරු සඳහා අදාළ බලධාරීන්ගෙන් අනුමැතිය ලබා ගැනිමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

## 2. ශීර්ෂය 253 – විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

### 2.1 විගණන විෂය පථය

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා ආදායම් ගිණුම් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 දෙසැම්බර් 29 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය,

අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 2.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඊ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 2.4 සිට 2.13 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|
| බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 |
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| පරිගණක උපාංග සහ මෘදුකාංග සම්බන්ධ ස්ථාවර වත්කම් ලේඛණය | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/2 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |

**(ආ) විගණන සාක්ෂි නොවීම**

**-------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විශ්‍රාම වැටුප් ගෙවීමේ අවිධිමත්භාවය පිළිබඳ ලැබී තිබූ නියෝජනයක් පරීක්ෂා කිරීම සඳහා කඩුවෙල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ තැපැල් කාර්යාල විසින් විශ්‍රාම වැටුප් ගෙවා ආපසු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට එවන ලද විශ්‍රාම වැටුප් ගෙවීම් ලැයිස්තු ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටියද ඒවා විනාශ වී ඇති බව විගණනයට දන්වා තිබුණි.

(ii) ද්විතියික පදනම මත මුදාහරින ලද නිළධාරින්ගෙන් වැන්දඹු හා අනත්දරු දායක මුදල් වැන්දඹු හා අනත්දරු අරමුදල් කාර්යාලයට ලැබෙන බව තහවුරු කර ගැනීමට සාක්ෂි නොවීය.

**(ඇ) අයවැය විචලනය**

**------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** වැය විෂයයන් 2 ක් සඳහා සලසා තිබුණු රු. 1,800,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

**(ii)** වැය විෂයයන් 07 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 50 සිට සියයට 94 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(iii)** විශ්‍රාමික ප්‍රතිලාභ වැය විෂයය සඳහා (253- 1-2 1502) රුපියල් මිලියන 77 ක ප්‍රතිපාදන ලබාගෙන තිබූ අතර එයින් රුපියල් මිලියන 22.5 ක් වෙනත් වැය විෂයයන්ට මාරු කිරීමෙන් පසුවද වසර අවසානයේ රුපියල් මිලියන 7.2 ක ඉතිරියක් නිරීක්ෂණය විය.

**(iv)** සමාලෝචිත වර්ෂයේදී පාරිතෝෂිත ගෙවීම් වැය විෂයය (253-1-2-1502 (ii) ) සඳහා ලබා දී තිබූ ප්‍රතිපාදනයෙන් රුපියල් මිලියන 6.2 ක් ගොඩනැගිලි හා

ඉදිකිරීම් වැය විෂයය සඳහාත් තවත් රුපියල් මිලියන 1,825 ක් සුභසාධක වැය විෂයය සඳහාත් මු.රෙ. 66 මඟින් මාරුකර තිබුණි. 2013 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබූ විශ්‍රාම පාරිතෝෂික අයදුම්කරුවන් සංඛ්‍යාව 13,140 ක් වූ අතර එදිනට ගෙවිය යුතු විශ්‍රාම පාරිතෝෂික මුදල රුපියල් මිලියන 7093. 9 ක් විය.පාරිතෝෂික ලබා ගැනීම සඳහා විශ්‍රාමිකයින් විශාල සංඛ්‍යාවක් පොරොත්තු ලේඛනයේ රැඳී සිටියදි එම ගෙවීම් සඳහා ලබා දී තිබූ ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන්ට මාරු කිරීම පිළිබඳව පිළිගත හැකි හේතුන් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**(v)** 2012 විසර්ජන ගිණුමේ "ඩීජීඑස්ඒ" ආකෘතියේ 2012 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම ලෙස රු. 111,743,343 ක් සඳහන් වූ අතර 2013 විසර්ජන ගිණුමේ "ඩීජීඑස්ඒ" ආකෘතියේ 2013 ජනවාරි 01 දිනට එම ශේෂය රු. 271,673,586 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව රු. 159,930,243 ක වෙනසක් නිරීක්ෂණය විය. මෙම වෙනසට හේතු පැහැදිලි නොකල අතර වැඩිපුර ගෙවූ බවට අනාවරණය වූ විශ්‍රාම වැටුප් නැවත අයකිරීම් සිදුකිරිමේදි දෙපාර්තමේන්තුව විසින් ලේඛන පවත්වාගෙන ගොස් තිබූ නමුත් ඒවා යාවත්කාලින කර නොතිබූ බැවින් ඒ පිළිබඳව විගණනයේදි කරුණු අනාවරණය කරගැනිමට අපහසු විය.

**(ඈ) පොදු තැන්පත් ගිණුම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

2013 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුම් ශේෂය රු. 9,464,427 ක් වූ අතර රම්බොඩ නිවාඩු නිකේතනය ඉදිකිරීම සඳහා විශ්‍රාමිකයින්ගෙන් වැටුපෙන් අයකල මුදලින් ඉතිරිව තිබූ රු. 491,870 ක මුදලක් විශ්‍රාමිකයන් වෙත ගෙවිමට හෝ වෙනත් කිසිවක් සිදුනොකර වර්ෂ 3 ත් - 4 ත් අතර කාලයක් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

**(ඉ) ආදායම් ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i) ආදායම් සංකේත අංකය 20:04:02:00 - සමාජ සංරක්ෂණ දායක මුදල් (පළාත් සභා)**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- වාර්ෂික අයවැය ප්‍රකාශය අනුව සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම රු.4,340,000,000 ක් වූ අතර වර්ෂය අවසාන වන විට රු.6,278,095,915 ක ආදායම් රැස්කර තිබුණත්, ඇස්තමේන්තුගත ආදායම සංශෝධනය කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි.
- ඉදිරිපත් කළ ගිණුමට අනුව එකතුව රු. 659,604,716 ක ආදායම් වර්ෂ 1 සිට වර්ෂ 2 ක් අතර කාල පරාසයක අදාලව හිඟහිට තිබුණි. එම හිඟහිටි ආදායම් අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.
- මුදල් රෙගුලාසි 128(2)(ඇ) ප්‍රකාරව ආදායම් සංකේතයට අදාලව අර්ධ වාර්ෂික හිඟහිටි ආදායම් පිළිබඳ වාර්තා පිළියෙල කර නොතිබුණි.
- මුදල් රෙගුලාසි 128 (2)(උ) සහ 2002 ජුලි 17 දිනැති අංක 1/2002 දරන රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව දායක මුදල් ලැබීම් විශ්ලේෂණය කළ හැකිවන පරිදි එක් එක් ආයතනයෙන් මාසිකව ලැබුණු දායක මුදල් පිළිබද වාර්තා පවත්වා නොතිබුණු බැවින් රු.591,296,880 ක් වූ හිඟහිටි ආදායමෙහි නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට නොහැකි විය. එමෙන්ම ප්‍රමාණවත් තොරතුරු නොමැති වීම නිසා හිඟ ආදායම අප්‍රමාදව අයකර ගැනීමට අවශ්‍ය වන විධිවිධාන සකස් කිරීමට දෙපාර්තමේන්තුවට නොහැකි වී තිබුණි.
- සමාලෝචිත වර්ෂයේදි පළාත් සභාවලින් සමාජ සංරක්ෂණ දායක මුදල් ලෙස රු.6,278,095,915 ක් ලැබී තිබුණි. එම ලැබීම් ඉකුත් මාසය සමග මාසිකව විශ්ලේෂණය කිරීමේදි සමහර මාසවල ඉකුත් මාසයට වඩා අඩුවීම රු.226,916,925 ක සිට වැඩිවීම රු.217,194,597 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි. එම විචලනයන්ට හේතු වූ කරුණු විගණනයට පැහැදිලි කර නොතිබුණි.
- වැරදීමකින් නියමිත මුදලට වැඩියෙන් ඒකාබද්ධ අරමුදලට බැර කෙරුණු සමාජ සංරක්ෂණ මුදල් ආපසු ගෙවීම සඳහා මුදල් රෙගුලාසි 118(2)(අ) ප්‍රකාරව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු වුවත්, එසේ නොකර සමාලෝචිත වර්ෂයේදී රු.3,098,275 ක් වූ සමාජ සංරක්ෂණ දායක මුදල් ආදායමෙන් ආපසු ගෙවීම වැන්දඹු අනත්දරු කාර්යාලයේ අධ්‍යක්ෂවරයාගේ හා ගණකාධිකාරීගේ අනුමත කිරිමෙන් හා සහතික කිරීමෙන් සිදු කර තිබුණි. එසේම ආපසු ගෙවීම් ලබා ගත් බවට අදාල පාර්ශවයන්ගෙන් තහවුරු කර ගෙන නොතිබුණි.

- සමාලෝචිත වර්ෂයේදී ආදායම් වශයෙන් ලැබී තිබුණු විවිධ අඩුපාඩු හේතුවෙන් ගිණුම් තැබීමෙන් තොරව අදාල ආයතන වෙත ආපසු හරවා යැවූ එකතුව රු.602,931 ක් වටිනා චෙක්පත් 22 ක් වෙනුවෙන් නැවත මුදල් ලබාගැනීමට හෝ සමාලෝචිත වර්ෂයේදී හිඟ ආදායම් ලෙස ගිණුම්ගත කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. එසේම මුදල් රෙගුලාසි 165(2)(අ) විධිවිධාන ප්‍රකාරව මාණ්ඩලික නිලධාරියකුගේ අධීක්ෂණය යටතේ එම කාර්ය සිදු කර නොතිබුණි.
- ද්විතියික පදනම මත මුදාහරින ලද නිලධාරින්ගේ දායක මුදල් ලැබීම් සම්බන්ධ කිසිදු ලේඛනයක් වැන්දඹු හා අනත්දරු කාර්යාලය විසින් පවත්වා නොතිබුණි. හිඟ දායක මුදල් අදාල ආයතනවලින් ගෙන්වා ගැනීමටත්, ආදායම් ගිණුම්වල හිඟ දායක මුදල් සටහන් කිරීමට හෝ කටයුතු කර නොතිබු ණි.

**(ii)** **ආදායම් සංකේත අංකය 20:04:01:00 (මධ්‍යම රජය) සමාජ සංරක්ෂණ දායක මුදල්**

---

පහත සදහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- 2013 වර්ෂය සඳහා වූ ඇස්තමේන්තුගත ආදායම් රු.8,528,000,000 ක් වී තිබුණු අතර වර්ෂය අවසාන වන විට රු.8,866,646,032 ක ආදායමක් රැස්කර තිබුණි. ඇස්තමේන්තුගත ආදායම ඉක්මවා ආදායම් රැස්කර තිබුණත්, මුල් ඇස්තමේන්තුව සංශෝධනය කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.
- සමාලෝචිත වර්ෂයේ ජුනි 30 දිනට සහ දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම් පිළිබඳව "හිස් වාර්තා" ඉදිරිපත් කර තිබුණද, 2013 දෙසැම්බර් 31 දින වන විට රු.5,185,435 ක හිඟ ආදායම් පවතින බව විගණනයේදි අනාවරණය විය.
- ක්‍රමානුකූල ලේඛන පවත්වා නොතිබුණු නිසා යම් නිශ්චිත දිනයකට පවතින හිඟ ආදායම් අදාළ වන ආයතන හා කාල වකවානු පිළිබඳව තොරතුරු ලබා ගැනීමට නොහැකි විය.
- 2001 ජනවාරි 15 දිනැති අංක 1/2001 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය ප්‍රකාරව සෑම මාසයකම ගිණුම් සාරංශ මඟින් හර හා බැර කරන ලද මුදල් පිළිබඳ වාර්තා ඊලඟ මාසයේ 15 දිනට ප්‍රථම විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත එවිය යුතු වුවත්, බොහෝ ආයතන එම විධිවිධාන ප්‍රකාරව වාර්තා ඉදිරිපත්

කර නොතිබුණු අතර එම වාර්තා ගෙන්වා ගැනිමට දෙපාර්තමේන්තුව විසින් විධිමත් ක්‍රියාමර්ග ගෙන නොතිබුණි.

- සමාලෝචිත වර්ෂයේදී ආදායමෙන් ආපසු ගෙවා තිබූ රු.7,445,323 ක් වූ අතර එයින් රු.1,441,262 ක් වූ ගෙවීම් තහවුරු කර ගැනීම සඳහා පහත දැක්වෙන පරිදි අදාල ආයතන වලින් හර නිවේදන ගෙන්වා ගැනීමට ප්‍රමාණවත් පරිදි කටයුතු කර නොතිබුණි.
  - 2011 වර්ෂයේදි ආදායමෙන් ආපසු ගෙවන ලද රු.1,597,731 ක වටිනාකමද 2012 වර්ෂයේදි ආදායමින් ආපසු ගෙවන ලද රු.222,136 ක වටිනාකමද තහවුරු කර ගැනීම සඳහා අදාල ආයතන වලින් හර නිවේදන ගෙන්වා ගෙන නොතිබුණි.
  - සමාලෝචිත වර්ෂයේදී ආදායමින් ආපසු ගෙන ලද රු.7,445,323 කින් රු.7,017,283 ක් වූ ආදායම් ආපසු ගෙවීම් සඳහා අදාල අනුමැතිය ලබාගෙන නොතිබුණි.
- මධ්‍යම රජයට අයත් ආයතනයන්ට අදාල නිලධාරින්ගේ වැන්දඹු, අනත්දරු හා වැන්දඹු පුරුෂ දායක ලැබීම් පිළිබඳ තොරතුරු කිසිවක් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සතුව නොතිබීම නිසා ආදායමෙන් ආපසු ගෙවීමේදි හා හිඟ ආදායම් ගණනය කිරීමේදි ඒවායේ නිවැරදිතාවය තහවුරු කර ගැනිමට නොහැකි විය.
- වැන්දඹු හා අනත්දරු කාර්යාලය විසින් මධ්‍යම රජයේ සමාජ සංරක්ෂණ ගිණුමට අදාල වූ ද්විතික පදනම මත මුදාහරින ලද නිලධාරින්ගේ දායක මුදල් ලැබීම් සම්බන්ධව කිසිදු ලේඛනයක් යාවත්කාලීන කර නොතිබුණු අතර එම පිරිස සම්බන්ධයෙන් කිසිදු අවධානයක් යොමු කර නොතිබුණි. එම නිලධාරින්ගේ හිඟ දායක මුදල් අදාල ආයතන මඟින් ගෙන්වා ගැනීමට හා ආදායම් ගිණුම්වල එම වටිනාකම් හිඟ ආදායම් ලෙස වාර්තා කිරීමටද කටයුතු කර නොතිබුණි.

**(ඊ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විෂය අංක 25301 දරන අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව

රු.2,147,493 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ii) 2013 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පොත් අනුව රු. 4,796 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර එම වෙනස වර්ෂ ගණනාවක සිට ඉදිරියට එමින් පැවති ශේෂයක් විය.

(iii) 2013 දෙසැම්බර් 31 දිනට කේවල ශේෂ වර්ගීකරණ සාරංශයේ සම්පූර්ණ එකතුව හා පාලන ගිණුමේ ශේෂය අතර රු.272,203 ක වෙනසක් නිරික්ෂණය වූ අතර එම වෙනස තුළ රු.134,664 ක් වූ ශේෂයක් දිර්ඝ කාලයක සිට පැවත එමින් තිබුණි. .

(iv) 1990 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ ස්ථාන මාරුවීම් ලබාගිය නිලධාරින් දහතුන් දෙනෙකුගේ හිග හිටි රු.647,293 ක ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(v) වැඩ තහනම් කර තිබූ හා සේවය හැර ගිය නිලධාරින්ගෙන් අයවිය යුතු රු.424,374 ක ණය ශේෂය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

### 2.4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2//3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියේ 1.4.1 ඡේදය ප්‍රකාරව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 2.4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

**2.4.3 අභ්‍යන්තර විගණනය**

-------------------------

2013 දෙසැම්බර් 31 දින වනවිට, අභ්‍යන්තර විගණන අංශය විසින් ක්ෂේත්‍ර පරීක්ෂාවන්හිදී අනාවරණය කර ගන්නා ලද වැඩිපුර ගෙවන ලද විශ්‍රාම වැටුප් රු.131,229,776 ක් වූ අතර අවුරුදු 10 ට වැඩි කාලයකට අදාලව අයවිය යුතු ශේෂය රු.මිලියන 45 කි. වැඩිපුර ගෙවීම් අයකර ගැනීමේ ප්‍රගතිය දුර්වල මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.

**2.5 වත්කම් කළමනාකරණය**

-----------------------------

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය මඟින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර 2013 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කර එම වාර්තා 2014 මාර්තු 15 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් එම වාර්තා 2014 මැයි 31 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2012 වර්ෂය වෙනුවෙන් පවත්වා තිබුණි.

(ආ) 2012 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි**.**

(ඇ) දෙපාර්තමේන්තුව සතු වාහන සඳහා ඉන්ධන මිලදී ගැනීමේ දී ඉන්ධන ඇනවුම් පොත් භාවිතා කිරිමට කටයුතු කර නොතිබුණි.

(ඈ) "පොදු වාර්තා 47" වාර්තාවලින් නිර්දේශ කර තිබු විකිණිය යුතු, විනාශ කළ යුතු, ප්‍රතිසංස්කරණය කළ යුතු සියළුම භාණ්ඩ පිළිබඳ විස්තර සාරාංශ ගත කර නොතිබූ අතර, පුවත්පත් දැන්වීම් සඳහා රු.55,776 ක් වැයකර 2013 දෙසැම්බර් 05 දින පවත්වන ලද වෙන්දේසියේදි අලෙවි වූ භාණ්ඩවල වටිනාකම රු.133,200 ක් විය. අලෙවි වූ ප්‍රමාණයට වඩා භාණ්ඩ විශාල ප්‍රමාණයක් වෙන්දේසි කිරිමට යෝජිතව තිබුණද වෙන්දේසි කටයුතු මනා සංවිධානයකින් තොරව සිදු කිරිම හේතුවෙන් එදින වෙන්දේසිය ඵලදායි වි නොතිබුණි.

**2.6 අනුකූල නොවීම්**

---------------------

**(අ) නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

-----------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති සහරෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) ව්‍යවස්ථාපිත විධිවිධාන** | | |
| 2008 අංක 03 දරන පාසල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් (සංශෝධන) පනතේ 3 වන වගන්තියෙන් සංශෝධිත ගුරු විශ්‍රාම වැටුප් ආඥාපනතේ 06 වන වගන්තිය | - | පාඨශාලීය ගුරුවරුන් වෙනුවෙන් දායක විශ්‍රාම වැටුප් අරමුදල් ගිණුමක් පවත්වා නොතිබූ අතර මුදල් වර්ෂය සඳහා අරමුදල පිළිබඳව මූල්‍ය ප්‍රකාශන හා ගනුදෙනු පිළිබඳ විස්තරයක්ද, අරමුදල ක්‍රියාවෙහි යෙදවීම පිළිබඳ වාර්තාවක්ද පිළියෙල කර නොතිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) මුදල් රෙගුලාසි 880 හා 881 | - | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ තනතුරු වර්ග 14 කට අයත් නිලධාරීන්ගෙන් ඇප ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 1645 (අ) | - | වාහන ලොග් සටහන් පොත් යාවත්කාලීන කර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 1645 (ආ)(ඇ) හා 1646 | - | දෛනික ධාවන සටහන් හා මාසික සංසිද්ධි වාර්තා සෑම මසකම 15 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි 135 සිට 139 | - | බැංකු සැසඳුම් ප්‍රකාශයෙහි දක්වා තිබුණු නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ එකතුව රු.18,191,684 ක් වූ චෙක්පත්වලට අදාල ගෙවීම් සඳහා අධිකාර බලය, අනුමත කිරීම, සහතික කිරීම හා ගෙවීම යන අවස්ථාවලදී වගකිවයුතු නිලධාරීන් මුදල් රෙගුලාසිවල සඳහන් |

විධිවිධානවලට අනුව කටයුතු කර නොතිබුණි.

භාණ්ඩ හෝ සේවා සැපයීම නිසි ලෙස ඉටුකළ බවට සහතිකයක් නොමැතිව, විදුලි ජනක යන්ත්‍රයක් හා භෝජනාගාරය හා වැසිකිළි පද්ධතිය නවීකරණය සඳහා එකතුව රු. 6,946,733 ක් වූ ගෙවීම් වවුචර් 03 ක් සඳහා චෙක්පතක් ලියා තිබුණි.

(v) මුදල් රෙගුලාසි 237 - ගෙවීම් වවුචර් 14 ක් මගින් එකතුව රු.23,429,722 ක් ගෙවා තිබුණත්, එම ගෙවීම් තහවුරු කිරිමට අදාළ ලේඛන, බිල්පත්, සහතික ආදිය ඉදිරිපත් කර නොතිබුණි.

වායුසමීකරණ යන්ත්‍ර 7 ක් සවිකිරීම සඳහා රු.1,899,430 ක් 2013 දෙසැම්බර් 26 දින ගෙවා තිබුණි. එම ගෙවීම කිරිමට ප්‍රථම අදාල සවි කිරීම නිම කර ඒ බව අධික්ෂණ නිලධාරියාගේ සහතිකය ඉදිරිපත් කළ යුතු වුවත්, අදාල නිම කිරිම හා සහතික ඉදිරිපත් කර තිබුණේ ගෙවීම් කළ පසු පිළිවෙලින් 2014 ජනවාරි 30 දින හා 201පෙබරවාරි 03 දිනවලදීය.

(ඇ) **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

(i) අංක 41/91 දරන හා 1990 ඔක්තෝබර් 10 දිනැති චක්‍රලේඛය - දෙපාර්තමේන්තුව සතු සෑම වාහනයකම මාස 6 කට වරක් ඉන්ධන දැවිම පරීක්ෂා කර නොතිබුණි.

(ii) අංක 01/2002 හා 2002 පෙබරවාරි 25 දිනැති චක්‍රලේඛය - දෙපාර්තමේතුවේ වාහන සඳහා රාජ්‍ය ලාංඡනය හා දෙපාර්තමේන්තුවේ නාමය චක්‍රලේඛය ප්‍රකාරව යෙදීමට කටයුතු නොකර දෙපාර්තමේන්තු නාමය එහා මෙහා කළ හැකි පුවරු යොදා තිබුණි.

**2.7 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා**

ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම් හා භාණ්ඩ හා සේවා සැපයීම් රහිතව මුදල් නිදහස් කිරිම පිළිබඳව, විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

**(අ) ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්**

රාජ්‍ය ආයතන ප්‍රතිනිර්මාණය කිරිමේ වැඩසටහන යටතේ 2004 වර්ෂයේදී රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) එක්ව විශ්‍රාම වැටුප් ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂම හා ඵලදායි අයුරින් ඉටුකර ගැනීමේ අරමුණින් විශ්‍රාම වැටුප් දෙපර්තමේන්තුවේ "ඉ - විශ්‍රාම වැටුප් ව්‍යාපෘතිය" ආරම්භ කර තිබුණි. එහි නියමු ව්‍යාපෘතිය 2011 සැප්තැම්බර් 20 දින නිම කර තිබුණත්, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් පුහුණුව සඳහා කළ වියදම් හා අනෙකුත් වියදම් හැර රු. මිලියන 174 ක් වැය කිරීමෙන් පසුව පද්ධතියේ හටගත් තාක්ෂණික දෝෂයන් නිසා 2013 නොවැම්බර් 01 දින සිට එම ව්‍යාපෘතිය සම්පූර්ණයෙන්ම නවතා දමා තිබුණි.

**(ආ) ව්‍යාපෘති ඉටුකිරිම් ප්‍රමාදයන්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දෙපාර්තමේන්තුවේ වැසිකිලි පද්ධතිය ඉදිකිරිමේ කටයුතු සඳහා බස්නාහිර පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරියට 2013 දෙසැම්බර් 06 දින රු.2,000,000 ක් ගෙවා තිබුණි. 2013 දෙසැම්බර් 31 දින තවත් රු.2,000,000 ක් වු චෙක්පත ලියා තිබු නමුත් විගණන අවස්ථාව වනවිට ඇස්තමේන්තුවේ සඳහන් A,B, හා C යන අයිතම් එනම් කඩා ඉවත් කිරීම, කොන්ක්‍රිට් කිරීම හා පෙදරේරු වැඩ සඳහා වු රු.1,075,430 ක ඇස්තමේන්තුගත කාර්යයන් පමණක් ඉටුකර තිබුණි.

(ii) දෙපාර්තමේන්තුවේ තෙවන මහළ නවිකරණය සඳහා 2013 දෙසැම්බර් 26 දින ප්‍රසම්පාදනය පිරිනමා තිබු අතර, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලින්

බැහැරව සම්පූර්ණ ප්‍රසම්පාදන මුදල වූ රු.2,681,430 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. නමුත් මුදල් ගෙවා තිබුණු අවස්ථාව වන විට නවීකරණ කටයුතු ඉටු කිරීම ඉතාමත් ප්‍රාථමික මට්ටමක පැවතුන අතර, තෙවන මහළ නවීකරණ කටයුතු 2014 අප්‍රේල් 30 දින නිම කර තිබුණි.

**2.8 කාර්යසාධනය**

------------------

2013 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

---------------------------------------------------

දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු කර නොතිබුණු බවට නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) මාසික විශ්‍රාම වැටුප් ගෙවීම් කිරීම දෙපාර්තමේන්තුවේ ප්‍රධානතම කාර්ය වන නමුත් ඒ සඳහා විධිමත් පාලන ක්‍රම ස්ථාපිත කර නොතිබුණි.

(ii) 2011 ජනවාරි 30 දිනැති අංක 01/2011 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් ඒකාබද්ධ පාලන ගිණුමක් සැකසීමකින් තොරව මාසික විශ්‍රාම වැටුප් සඳහා ඉල්ලුම් කළ මුදලම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත ලබා දී තිබුණි.

(iii) ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ඉල්ලුම් කරනු ලබන මාසික විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධව කාර්යභාරයයන් දෙපාර්තමේන්තුව විසින් එක් නිලධාරියෙකු වෙත පවරා තිබූ අතර අභ්‍යන්තර පරීක්ෂාවක් ඇතිවන පරිදි රාජකාරි පැවරුම් සිදුකර නොතිබුණි.

(iv) විශ්‍රාම වැටුප් දත්ත පද්ධතියේ, දත්ත ඇතුළත් කර නොමැති කාලච්ඡේදයන් පවතින අතර එසේ විමට හේතු වූ කරුණු හා ඊට වගකිව යුතු නිලධාරීන් හඳුනා ගැනීමට හෝ ඊට පිළියම් යෙදවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනිමට කටයුතු කර නොතිබුණි.

(v) ප්‍රතිපාදන සළසන ලද වැය විෂයන්ට අනුව විශ්‍රාම වැටුප් වියදම වැය ලෙජරයේ සටහන් කර නොතිබුණි.

(vi) 2014 ජූලි මාසයට අදාළව දෙපාර්තුමේන්තුවේ ගිණුම් අංශයේ විශ්‍රාම වැටුප් වියදම හා විශ්‍රාම වැටුප් දත්ත පද්ධතියේ විශ්‍රාම වැටුප් වියදම අතර රු. 691,004,249 ක වෙනසක් පැවතුණද, එම වෙනසට හේතුන් හඳුනාගෙන සත්‍ය විශ්‍රාම වැටුප් වියදම තහවුරු කර ගැනිමට ක්‍රමවේදයක් ස්ථාපිත කර නොතිබුණි.

(vii) දෙපාර්තමේන්තුව තුළ පැවති විශ්‍රාම වැටුප් දත්ත පද්ධතිය, ඉ- විශ්‍රාම වැටුප් ව්‍යාපෘතියට අදාළ වන පරිදි සකස් කිරීම සඳහා දත්ත ඇතුළත් කිරීමේදී වැරදි හා ව්‍යාජ දත්ත ඇතුළත් වීම වැළැක්වීම සඳහා කිසිදු ආරක්ෂක වැඩ පිළිවෙලක් ස්ථාපිත කර නොතිබුණි.

(viii) දෙපාර්තමේන්තුවේ විශ්‍රාම වැටුප් දත්ත පද්ධතියේ තිබෙන තීරු 55 න් තීරු සියල්ලම

සම්පූර්ණ කර නොතිබුණද, විශ්‍රාම වැටුප් ඉල්ලුම් කිරීමට හෝ ගෙවීමට එය බාධාවක් වී නොතිබූ අතර, 2014 ජුලි මාසයේ විශ්‍රාම වැටුප් දත්ත පද්ධතිය අනුව බැංකු ගිණුම් අංකයක් නොමැති විශ්‍රාමිකයින් 100,915 ක්ද ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් නොමැති විශ්‍රාමිකයින් 148,248 ක්ද සිටියදී පවා විශ්‍රාම වැටුප් ගෙවා තිබුණි.

(ix) ස්ලිප් (slip) ක්‍රමයට විශ්‍රාම වැටුප් ගෙවීමේදී, විශ්‍රාමිකයින්ගේ ගිණුමට බැර නොවූ 2013 වර්ෂයේ රු.21,143,462 ක් වූ නොගෙවූ විශ්‍රාම වැටුප්, විශ්‍රාම වැටුප් දත්ත පද්ධතියෙන් ඉවත් කිරීමට කටයුතු කර නොතිබූ අතර එය විශ්‍රාම වැටුප් දත්ත පද්ධතිය තුළ වියදමක් ලෙස පැවතුණි.

(x) තැපැල් කාර්යාල හා බැංකු ශාඛා මගින් විශ්‍රාම වැටුප් ගෙවීමේදි නොගෙවන ලද විශ්‍රාම වැටුප් නිශ්චිතව හඳුනා ගෙන විශ්‍රාම වැටුප් දත්ත පද්ධතියෙන් ඉවත් කිරීමට කටයුතු කර නොතිබූ අතර වියදමක් ලෙස තව දුරටත් අනාවරණය වීමට ඉඩ හැර තිබුණි.

(xi) තැපැල් කාර්යාල හරහා විශ්‍රාම වැටුප් ගෙවීමේදි නොගෙවූ විශ්‍රාම වැටුප් තැපැල් දෙපාර්තමේන්තුව මඟින් කඩිනමින් ආපසු ගෙන්වා ගැනීමට පියවර ගෙන නොතිබූ අතර, 2013 දෙසැම්බර් 31 දින වන විට, රු.12,823,128 ක නොගෙවූ විශ්‍රාම වැටුප් තැපැල් කාර්යාලවලින් තැපැල් දෙපාර්තමේන්තුව වෙත ලැබිය යුතුව තිබුණි.

## 2.9 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුවේ බැංකු ජංගම ගිණුමේ 2013 දෙසැම්බර් 31 දිනට හා 2014 ජනවාරි 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශන පරික්ෂාවේදී 2013 දෙසැම්බර් 31 දිනට රු.867,799,925 ක් වටිනා චෙක්පත් 1766 ක් හා 2014 ජනවාරි 31 දිනට 2013 වර්ෂයට අදාල රු.48,023,442 ක් වටිනා චෙක්පත් 140 ක් නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත් වශයෙන් දක්වා තිබුණි.

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට ගෙවීම් ලෙස මුදල් පොතේ සටහන් කර ආදායකයින්ගේ නමට ලියා තිබුණු රු.18,191,684 ක් වටිනා චෙක්පත් 11 ක්, 2014 පෙබරවාරි 25 දින විගණන පරීක්ෂණ අවස්ථාව වන විටත් අදාල පාර්ශවයන් වෙත භාර දි නොතිබුණි.

## 2.10 අවිධිමත් ගනුදෙනු

දෙපාර්තමේන්තුව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**(අ) අධිකාර බලය නොමැති වූ ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ වැන්දඹු හා අනත්දරු අංශය විසින් සිවිල් හා හමුදා විශ්‍රාමිකයන්ගේ අයදුම්පත් 2606 වෙනුවෙන් 2013 ජනවාරි 01 දින සිට 2013 සැප්තැම්බර් 30 දින දක්වා කාලය තුළදී කිසිදු නිතීමය විධිවිධානයකින් තොරව එම දායක මුදලින් රු.133,731,886 ක් ආපසු ගෙවා තිබුණි.

(ii). 2010 අංක 08 දරන වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් (සංශෝධිත) පනත හා 2010 දෙසැම්බර් 16 දිනැති අංක 13/2010 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛයේ විධිවිධාන අතර ගෙවීම පිළිබඳව පරස්පරතාවයක් පැවැතී තිබුණද, එය නිවැරදි කර ගැනීමට ක්‍රියාකර නොතිබුණි. 2013 ඔක්තෝබර් මාසයේ සිට 2014 දෙසැම්බර් මාසය දක්වා සිවිල් විශ්‍රාමික නිලධාරි අයදුම්පත් 14 ක් සඳහා වැන්දඹු හා අනත්දරු දායක මුදල ආපසු ගෙවීම නතර කර තිබුණි.

## 2.11 වැඩිපුර ගෙවීම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම හේතුවෙන් සිදුවී තිබුණු පාඩුව රු.111,743,343 ක් වු අතර 2013 දෙසැම්බර් 31 දිනට එම පාඩුව රු.133,229,770 ක් දක්වා වැඩි වි තිබුණි.

(ආ) විශ්‍රාමිකයා මියයෑමෙන් අනතුරුව ඔහුගේ යැපෙන්නන් වෙත වැන්දඹු අනත්දරු දායක මුදල ද විශ්‍රාමිකයාට ගෙවමින් තිබු විශ්‍රාම වැටුපද යන දෙකම ගෙවීම් කර තිබු අවස්ථාවක් නිරික්ෂණය වු අතර ඒ අනුව රු.712,278 ක් වැඩිපුර ගෙවා තිබුණි. එම වැඩිපුර ගෙවා තිබුණු වැන්දඹුවගෙන් වාරික වශයෙන් අයකර ගැනීමට කටයුතු කර තිබුණද, අදාල ගෙවීම සිදුකළ නිලධාරින්ට එරෙහිව කිසිදු විනය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## 2.12 කළමනාකරණ දූර්වලතා

විශ්‍රාම වැටුප් දෙපාර්තමෙන්තුවේ එක් එක් අංශ පිළිබඳ පරික්ෂාවේදි පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) **ගිණුම් අංශය**

දෙපාර්තමේන්තුවේ ශීර්ෂය යටතේ යුද්ධයේදී මියගිය හා ආබාධිත රණවිරුවන් සඳහා වයස අවුරුදු 55 තෙක් වැටුප් ගෙවීම සඳහා 2013 වර්ෂයේදී රු.මිලියන 16,152 ක ප්‍රතිපාදන සන්නද්ධ අංශයන් වෙත ලබාදී තිබුණද, එම ප්‍රතිපාදන උපයෝජනය පිළිබඳව වියදම් වාර්තා විධිමත්ව ලබාගෙන නොතිබූ අතර, එම ප්‍රතිපාදන උපයෝජනය පිළිබඳව දෙපාර්තමේන්තුවේ සම්බන්ධීකරණයක් හා අධීක්ෂණයක් සිදු කර නොතිබුණි.

(ආ) **තැපැල් අංශය**

තැපැල් අංශයට ලැබෙන ලිපි නිවැරදි ලෙස හඳුනාගෙන අදාල අංශ වෙත යොමු කර නොතිබීම නිසා එම ලිපි නැවත තැපැල් අංශය වෙත යොමු කර තිබුණි. එකම ලිපිය ස්ථාන 5 කට පමණ යොමුකර නැවත තැපැල් අංශය වෙත යොමුකර තිබුණු අවස්ථාවන්ද නිරීක්ෂණය විය. නියැදි විගණන පරීක්ෂාවේදී ලිපි 05 ක් දින 32 සිට දින 305 ක් අතර කාලයක්, නියමිත අංශයට යොමු කර ගැනීමට නොහැකිව 2013 ඔක්තෝබර් මාසය දක්වාම තැපැල් අංශයේම රඳවාගෙන තිබුණි. ඒ හේතුවෙන් මුල් අවස්ථාවේදීම සිදුවන ප්‍රමාදයන් නිසා, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේන් අපේක්ෂා කරන, සේවාලාභීන්ගේ අවශ්‍යතා කඩිනමින් ඉටු කිරීමට බාධාවක් වී තිබුණි. තැපැල් අංශයේ කාර්යයන් ඵලදායිව හා කාර්යක්ෂමව පවත්වා ගෙන යාමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) **ලියාපදිංචි ශාඛාව**

ලියාපදිංචි ශාඛාව වෙත ලැබෙන විශ්‍රාම වැටුප් අයදුම්පත්‍රවලින් සියයට 25 ක් පමණ එක් අවස්ථාවක් හෝ ප්‍රතික්ෂේප කර තිබූ අතර ඒ සඳහා අත්සන නොමැති වීම, නිල මුද්‍රාව නොමැති වීම, අදාල ආකෘතිය නිවැරදි නොවීම, සේවා කාලය නිවැරදි නොවීම, බැංකු ගිණුම් අංකය නිවැරදි නොවීම යනාදිය හේතු වී තිබූ අතර එම තත්ත්වය අඛණ්ඩවම සිදු වී තිබුණි. එම අඩුපාඩු මඟ හරවා ගැනීමට විධිමත් වැඩපිළිවෙලක් දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දී නොතිබුණි.

**(ඇ) වැන්දඹු හා අනත්දරු කාර්යාලය**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් කාර්යාලයේ ප්‍රධාන ශාඛාවේ එක් නිලධාරියෙකුගෙන් ලබාගත් ලිපිගොනු හතරක් පිළිබඳව සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ඉල්ලීම් සිදුකර වසර 11 කට වැඩි කාලයක් ගත වී තිබුණත්, එම ඉල්ලීම් අයදුම් පත ඉදිරිපත් කිරීමේ අඩුපාඩු, ලිපිගොනු කටයුතු ආරම්භ කිරීමට විශාල කාලයක් ගැනීම. ඉල්ලුම් කළ තොරතුරු නොලැබීම, සිහි කැඳවීම් අතර විශාල කාල පරාසයක් පැවැතීම, අයවිම් විස්තර විනාශ වීම යනාදි වශයෙන් වූ හේතූන් මත එම වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම් කර නොතිබුණි.

(ii). අවිවාහක නිලධාරින්ගේ වැන්දඹු හා අනත්දරු දායක මුදල් ආපසු ලබාගැනීමට යොමු කර තිබු දායක මුදල් ඉල්ලුම්පත් 10 ක ගෙවීම්, පිළිබඳව සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී, සම්පූර්ණ තොරතුරු සහිතව ලැබී තිබු අයදුම්පත් 8 ක් සඳහා ගෙවීම් කිරීමට කිසිදු හේතුවකින් තොරව අවුරුදු 1 මාස 1 සිට අවුරුදු 1 මාස 8 දක්වා කාල පරාසයක් ගතකර තිබුණි.

**(ඉ) සන්නද්ධ අංශයේ සේවයේ නියුතු නිලධාරින්ට වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ලියාපදිංචි අංක ලබාදීම**

-----------------------------------------------------------------------------------------------

වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ශීර්ෂය යටතේ සන්නද්ධ අංශයේ සේවයේ නියුතු නිලධාරීන්ට විශ්‍රාම හා වැන්දඹු ප්‍රතිලාභ සහ පාරිතෝෂිත මුදල් සඳහා ප්‍රතිපාදන සළසා තිබුණද, ඔවුන් සම්බන්ධයෙන් වැන්දඹු හා අනත්දරු ලියාපදිංචි අංක ලබාදීම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ පාලනයෙන් බැහැර වී තිබුණි.

**(ඊ) වාර්ෂික ස්ථාන මාරුවීම් ලබාදීම**

-----------------------------------

2005 වර්ෂයේ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත විශ්‍රාම වැටුප් නිලධාරින් බඳවා ගෙන තිබුණි. වසර 09 කට පසුව ඔවුන්ට ස්ථාන මාරුවීම් 2014 ජනවාරි හා ජුලි යන මාසයන්හි ලබාදී තිබු නමුත්, තවදුරටත් වසර 04 සිට වසර 09 දක්වා වූ සේවා කාලය ඉක්මවූ ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල සේවය කරන නිලධාරින් 64 දෙනෙකු සඳහා සහ ප්‍රධාන

කාර්යාලයේ නිලධාරින් 42 දෙදෙනෙකු සඳහා ස්ථාන මාරුවීම් ලබාදීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

**(උ) ගුරුවරුන්ගේ මූලික වැටුපෙන් අවකරණය කරනු ලබන සියයට 6 ක දායකය**

1953 අංක 44 දරන පාඨශාලා ගුරු විශ්‍රාම වැටුප් පනත සහ 1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනත යටතෙහි විශ්‍රාම වැටුප් හිමිකම ලබන ගුරුවර/ගුරුවරියන් තම මූලික වැටුපෙන් සියයට 6ක් දායක මුදල් වැටුපෙන් අවකරණය කර අදාල පිරිවෙන් හා උපකෘත පාසැල් අයත් කලාප කාර්යාල විසින් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කළ යුතුය. දෙපාර්තමේන්තුව විසින් එම දායක මුදල් නිසි පරිදි ගෙන්වා ගෙන හෝ වාර්තා පවත්වා ගෙන හෝ නොතිබු අතර, විමධ්‍යගත කර නොතිබු මෙම ගුරුවරුන් විශ්‍රාම යන අවස්ථාවේදී විශ්‍රාම වැටුප් දායක අරමුදල් වැටුපෙන් අඩුකිරිම, පිළිබඳව අදාල පිරිවෙන් හා උපකෘත පාසල් අයත් කලාප කාර්යාලයෙන් තොරතුරු ලබා ගෙන, එම තොරතුරු මත පදනම්ව විශ්‍රාම වැටුප් හිමිකම් තීරණය කර තිබුණි.

**(ඌ) ප්‍රාදේශිය ලේකම් කාර්යාල පරික්ෂාව**

ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල විශ්‍රාම වැටුප් ගෙවිම සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(i) **කඩුවෙල ප්‍රාදේශීය සභාව**

පහත සඳහන් නිරික්ෂනයන් කරනු ලැබේ.

- අඛණ්ඩව මාස 03 ක් විශ්‍රාම වැටුප් ලබා නොගැනීම සිදුවන විට විශ්‍රාම වැටුප් ගෙවීම අත්හිටවිය යුතු වුවත්, විශ්‍රාම වැටුප් ලබා නොගත්තද විශ්‍රාමිකයින්ට අවුරුදු 4 ක කාලයක් නොකඩවා විශ්‍රාම වැටුප් තැපැල් කාර්යාලය වෙත යවා තිබු අවස්ථා පැවැතුණි.
- තැපැල් කාර්යාල නොගෙවු ලෙස දක්වා ආපසු එවන විශ්‍රාම වැටුප් ප්‍රාදේශිය ලේකම් කාර්යාල විසින් විධිමත් පරිදි ලේඛනගත කර, තැපැල් කාර්යාලය හා විශ්‍රාමිකයා හඳුනාගත හැකි පරිදි සකස් කර විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි.
- විශ්‍රාම වැටුපක් හා වැන්දඹු විශ්‍රාම වැටුපක් එකම නිලධාරියකු ලබන අවස්ථාවකදි, එම විශ්‍රාමිකයා මියගිය විට, විශ්‍රාම වැටුප් දෙකම නැවැත්විය හැකි වන පරිදි, ලිපිගොනු අතර සම්බන්ධතාවයක් ඇති කර නොතිබුණි.

- 2012 හා 2013 වර්ෂවල මියගිය විශ්‍රාමිකයින්ගේ මරණ සහතික ඉදිරිපත් කිරිමෙන් පසුවද විශ්‍රාම වැටුප් අත්හිටුවීමකින් තොරව විශ්‍රාමිකයන්ගේ ගිණුම්වලට බැර කරන ලද රු.2,489,200 ක් වූ අතර, බැංකු හරහා ATM පහසුකම් මඟින් එම මුදල් විශ්‍රාම වැටුප් හිමියන්ගේ යැපෙන්නන් විසින් ලබාගෙන තිබුණි. එසේ වැඩිපුර ගෙවූ මුදලින් 2014 ජුනි මාසය වන විට රු.297,945 ක් ආපසු අයකරගෙන තිබුණි. මේ පිළිබඳව පරික්ෂා කර බලා ඊට වගකිව යුතු නිලධාරින්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනිමට කටයුතු කර නොතිබුණි.

**(ii) දොළුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය**

විශ්‍රාම වැටුප් ලිපිගොනුවකට පැවැතිය යුතු වාර්තා සටහන, වාර්ෂිකව ඉදිරිපත් කළ යුතු විශ්‍රාම සහතිකය, පිළියෙල කළ, පරික්ෂා කළ, අනුමැතිය සහිත වැටුප් සංශෝධන විස්තර. බැංකු ගිණුම් අංක මාරු කිරිම් විස්තර යනාදි නෛතික ලියකියවිලි නොතිබියදිත්, විශ්‍රාමිකයින් 5 දෙනෙකු සම්බන්ධයෙන් ලිපිගොනුවක් නොතිබියදිත්, විශ්‍රාම වැටුප් ගෙවිමට කටයුතු කර තිබුණි. එසේම බැංකු බද්ධ ගිණුම් 3 ක් සඳහාද උපදෙස් නොතකා වැටුප් බැර කර තිබුණි.

**(එ) විශ්‍රාම වැටුප් ගෙවීම බැංකු පද්ධතිය හරහා ක්‍රියාත්මක කිරීම හා අභ්‍යන්තර පාලන ක්‍රම**

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(i) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින්, විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා මුදල් මුදාහැරීම පිණිස විශ්‍රාම වැටුප් දත්ත පද්ධතිය ස්ථාපිත කිරීමේදි අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ස්ථාපිත කිරීමකින් තොරව වෙනස්කම් සිදු කර තිබුණි.

(ii). බැංකු ක්‍රමය හරහා විශ්‍රාම වැටුප් ගෙවීමේ ක්‍රමවේදය ස්ථාපිත කිරීමේදි තිබූ දූර්වල පාලනයන් හා පහත සඳහන්, අවිධිමත් තත්ත්වයන්ද විශ්‍රාම වැටුප් අක්‍රමිකතාවයන් ඇති වීමට බෙහෙවින්ම බලපා තිබුණි.

- දෙපාර්තමේන්තුව විසින් වරින් වර විශ්‍රාම වැටුප් අංක ලබාදිමේ ක්‍රමවේදය මධ්‍යගතව හා විමධ්‍යගතව ඇති කිරිම තුළින් විශ්‍රාම වැටුප් අංක ලබාදිමේ ඒකාකාරි ක්‍රමයක් නොතිබීම හේතුවෙන් එකම විශ්‍රාම වැටුප් අංකය විශ්‍රාමිකයින් විශාල පිරිසකට නිකුත් කර තිබුණි.

- විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධයෙන් ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරින් වෙත මුදල් රෙගුලාසි 145(2)(3) විධිවිධාන ප්‍රකාරව, විධිමත් පරිදි කාර්යභාරයන් පැවරීම සිදු කර නොතිබුණි.
- සියළුම වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් සඳහා ප්‍රදාන පත්‍ර නිකුත් කිරිම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ පාලනයෙන් තොරව සිදුකර කර තිබුණි.
- නිලධාරියකු විශ්‍රාම යන අවස්ථාවේ පවතින වැන්දඹු අනත්දරු ගොනුව සම්පූර්ණ කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් වැන්දඹු හා අනත්දරු ගෙවීම්වල විශාල ප්‍රමාදයක් පැවතීම හා ඒ අනුව හිඟ වැන්දඹු හා අනත්දරු ගෙවීම්වල ප්‍රමාණය ඉහල යාම.
- විශ්‍රාම වැටුප් නිලධාරින් හා ඒ සම්බන්ධ කාර්යයන්හි නියතු නිලධාරින් වරින් වර ස්ථාන මාරුකර, ස්ථාන මාරුවීම් ප්‍රතිපත්තිය පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි.
- ප්‍රාදේශිය ලේකම් කාර්යාල වෙත අනුයුක්ත කර ඇති විශ්‍රාම වැටුප් නිලධාරින් වෙත වැඩ පැවරීමේදි අභ්‍යන්තර පරීක්ෂාවක් ඇති වන අයුරින් නොපැවරීම හා අසීමිත බලතල පැවරීමක් සිදු කර තිබුණි. (ප්‍රදාන පත්‍ර අත්සන් කිරිම, දත්ත ඇතුළත් කිරීම වැනි)
- හඳුනාගන්නා ලද වැඩිපුර ගෙවීම් හා විශ්‍රාම වැටුප් වංචා සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි හා ආයතන සංග්‍රහය ප්‍රකාරව විධිමත් පරික්ෂණ පවත්වා එම නිලධාරින් සම්බන්ධයෙන් විධිමත් විනය ක්‍රියාමාර්ග ගැනීම ආරම්භයේ සිටම සිදු කර නොතිබුණි.
- බැංකු විසින් විශ්‍රාම වැටුප් අංකය, විශ්‍රාමිකයාගේ නම යනාදි තොරතුරුවලින් බැහැරව බැංකු ගිණුම් අංකය මත පමණක් පදනම්ව විශ්‍රාම වැටුප් බැංකුගත කිරිම හා ඒ සම්බන්ධයෙන් බැංකු සමඟ එකඟතාවකට එළඹ නොතිබුණි.

(iii) පහත සඳහන් අභ්‍යන්තර පාලන ක්‍රම නිසි පරිදි ක්‍රියාත්මක නොවිම නිසා විශ්‍රාම වැටුප් අක්‍රමිකතා ඇතිවිම කෙරෙහි බලපා තිබුණි.

- ජිවත්විම පිළිබඳ සහතික ඉදිරිපත් නොකලද , විශ්‍රාම වැටුප් ගෙවීම් කිරීම, මරණ සහතිකය ඉදිරිපත් කලද, විශ්‍රාම වැටුප නතර නොකිරිම හා එම සහතික කලට වෙලාවට ඉදිරිපත් කිරීමට ග්‍රාම නිලධාරින්ද කටයුතු කර නොතිබුණි.

- සක්‍රිය විශ්‍රාමිකයින්ගේ සංඛ්‍යාව හා විශ්‍රාම ගොනු සංඛ්‍යාව අතර නොසැසඳීම් පැවතීම හා විශ්‍රාම ගොනුවක් තුළ පැවතිය යුතු අත්‍යවශ්‍ය ලියවිලි විශ්‍රාම වැටුප් ලිපිගොනු තුළ නොතිබුණි.
- විශ්‍රාම වැටුප් ලබන නිලධාරින්ගේ විශ්‍රාම වැටුප් සම්බන්ධ ගණනය කිරීම්වලදී එකම කාරණය සම්බන්ධයෙන් ගණනයන් , කිහිප ආකාරයට සිදු කර තිබුණි.

(iv) විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය සඳහා සමස්ථ රාජ්‍ය ජාලයම හා සම්බන්ධවන නමුත් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව තම කාර්යභාරය නියමිත පරිදි ඉටුකිරීම සඳහා අනෙකුත් රාජ්‍ය ආයතනයන්ගේ දායකත්වය ප්‍රමාණවත් පරිදි ලබාගෙන නොතිබුණි.

## 2.13 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව | අතිරික්ත සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 22 | 22 | - | - |
| (ii) | තෘතියික මට්ටම | 11 | 03 | 08 | - |
| (iii) | ද්විතියික මට්ටම | 1,076 | 840 | 236 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 75 | 64 | 11 | - |
| (v) | අනියම් | - | 01 | - | 01 |
| | **එකතුව** | **1,184** | **930** | **255** | **01** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 255 ක් පිරවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

**(ආ) වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත්**

දෙපාර්තමේන්තුව විසින් වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක වර්ගය | සංඛ්‍යාව | වෙනත් පාර්ශවය | කාලපරිච්ඡේදය |
|---|---|---|---|
| කාන්තා පොලිස් සැරයන් | 1 | පොලිස් දෙපාර්තමේන්තුව | 2010 ජුනි 08 දින සිට |
| කාන්තා පොලිස් කොස්තාපල් | 1 | පොලිස් දෙපාර්තමේන්තුව | 2012 පෙබරවාරි 24 දින සිට |

## 3. ශීර්ෂය 254 - රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### 3.1 විගණන විෂය පථය

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා ආදායම් ගිණුම් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 දෙසැම්බර් 10 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සෙයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 3.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත්

කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 3.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඊ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 3.4 සිට 3.11 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|
| • බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 |
| • විධිහිනතා ලේඛන | රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ අත්පොතේ 375 වගන්තිය |

### (ආ) අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** වැය විෂයයක් සඳහා සළසා තිබුණු රු.1,000,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

**(ii)** වැය විෂයයන් 16 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 7 සිට සියයට 73 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(iii)** ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් මුදල් රෙගුලාසි 66 විධිවිධාන ප්‍රකාරව වෙනත් වැය විෂයයන් වෙත ප්‍රතිපාදන මාරු කිරීමෙන් පසුවද, අවස්ථා දෙකකදි සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 30 පමණ ප්‍රමාණයකින් ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි.

**(iv)** මුලික ඇස්තමේන්තුව මගින් සළසා තිබුණු ප්‍රතිපාදනයට අමතරව මුදල් රෙගුලාසි 66 විධිවිධාන ප්‍රකාරව රු.10,000,000 ක අතිරේක ප්‍රතිපාදන ලබාගෙන තිබූ නමුත් 254-01-02-2001 ගොඩනැගිලි හා ඉදිකිරීම් වැය විෂයයෙහි සමාලෝචිත වර්ෂය අවසානයේදී රු.4,484,710 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

**(ඇ) අග්‍රිම ගිණුම්**

------------

පහත සදහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව කාර්යය නිමකළ වහාම ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කළ යුතු වුවත් , කාර්යය නිම වී මාස 1 ක ප්‍රමාදයකින් පසුව අතුරු අග්‍රිමය නිරවුල් කර තිබුණි.

(ii) 2013 දෙසැම්බර් 31 දිනට මුදල් පොත පියවිම සම්බන්ධයෙන් 2012 නොවැම්බර් 20 දිනැති අංක 05/2012 දරන භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛයේ 2.1 ඡේදය ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පත්කළ බලයලත් නිලධාරියා විසින් 2013 දෙසැම්බර් 31 දිනට පසුව මුදල් පොත්වල කිසිදු ගනුදෙනුවක් සටහන් කළ නොහැකි පරිදි සටහන් තබා නොතිබුණි.

**(ඉ) ආදායම් ගිණුම්**

----------------

**(i) ආදායම් සංකේත අංකය - 10:03:02:00 (පැවරුම් බද්ද )**

---------------------------------------------------------

පහත සදහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- 2013 වර්ෂයේ මුල් ආදායම් ඇස්තමේන්තුව රු.මිලියන 112 ක් අතර සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව හා තථ්‍ය ආදායම අතර වෙනස රු.මිලියන 1,133.6 ක් වු බැවින් විධිමත් පරිදි ඇස්තමේන්තු කිරීමකින් තොරව ආදායම් ඇස්තමේන්තුව සංශෝධනය කර තිබුණි.
- 2004 නොවැම්බර් 25 දිනැති රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ උපදෙස් ලිපිය ප්‍රකාරව මෙරට දේපලක් විදේශිකයන්ට පැවරීමේදි ඔප්පුවේ සදහන් දේපලේ වටිනාකම නියමිත වටිනාකමට අඩුවෙන් සටහන් කර ඇතැයි අදාල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ රෙජිස්ට්‍රාර්වරයාට ඉතා පැහැදිලිව සැකයක් ඇතිවන අවස්ථාවේදි එම දේපලේ වටිනාකම් සම්බන්ධයෙන් ප්‍රධාන තක්සේරුකරුගේ වාර්තාවක් ලබාගත යුතු බවට දක්වා තිබුණි. ඒ අනුව

ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරු වාර්තා ලබා ගැනිමට කටයුතු කර නොතිබුණි. ප්‍රධාන තක්සේරුකරුගෙන් තක්සේරු වාර්තා ලබා ගැනීමේදී පවතින ප්‍රායෝගික අපහසුතාවය නිසා එම තත්ත්වය සිදු වී ඇති බව රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් විගණනය වෙත දන්වා තිබුණි.

- විදේශකයන්ට ඉඩම් පැවරීමේදි ආදායම් රැස්කිරීම සඳහා වෙන වෙනම පොත්පත් පවත්වාගෙන යාමට නිති සම්පාදනය කර තිබු නමුත් ඔප්පු ලියාපදිංචි කිරීම හැර විදේශිකයන් විසින් පවරාගෙන ඇති මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද යන්න තහවුරු කර ගැනීමට අදාල තොරතුරු ලබාගත හැකි පරිදි ලේඛනයක් පවත්වා ගැනීමට දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය කටයුතු කර නොතිබුණි.

**(ii) ආදායම් සංකේතය 10:03:08:00 - නොතාරිස්වරුන්ට වාර්ෂික මහාධිකරණ සහතික නිකුත් කිරීමේ ගාස්තු**

2013 සැප්තැම්බර් 03 දිනැති අංක FP/06/100/05/01(III) දරන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව නොතාරිස්වරුන්ට වාර්ෂික මහාධිකරණ සහතික නිකුත් කිරීමේ ගාස්තු 10:03:08:00 දරන ආදායම් සංකේතය යටතේ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ ආදායම් ශිර්ෂයට බැර කළ යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබු අතර හිස් ආදායම් වාර්තාවක් විගණනයට ඉදිරිපත් කර තිබුණි.

**(iii) ආදායම් සංකේතය - 10:03:07:02 - (ලියාපදිංචි කිරීමේ ගාස්තු)**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- වාර්ෂික ආදායම් ඇස්තමේන්තුව රු.මිලියන 808 වී තිබුණු අතර,ආදායම් ගිණුමේ එය රු.මිලියන 178 ක් වශයෙන් දක්වා තිබුණි. එමෙන්ම සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව රු.මිලියන 1,225 ක් වී තිබුණත්, අදායම් ගිණුමේ එය රු.මිලියන 1,025 ක් ලෙස රු.මිලයන 200 කින් අඩුවෙන් දක්වා තිබුණි.
- මුදල් රෙගුලාසි 128(2)(ඇ) ප්‍රකාරව සෑම මාස 6 කට වරක්ම හිඟ ආදායම් පිළිබඳ තත්ත්වය පෙන්නුම් කෙරෙන අර්ධ වාර්ෂික වාර්තා පිළියෙල කර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, එකි විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි.

- 2013 දෙසැම්බර් 31 දිනට එකතුව රු.3,137,366 ක ආදායම් හි ගහිටව පැවැති අතර, එම හිගහිටි ආදායම් පිළිබඳ කාල විශ්ලේෂණයක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එම හිගහිටි ආදායම් අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි. හිග ආදායම් අයකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.
  - ප්‍රාදේශීය ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 3 ක් සම්බන්ධයෙන් වූ අභ්‍යන්තර විගණන වාර්තාවලට අනුව හිගහිටි රු.861,264 ක් වූ ලියා පදිංචි ගාස්තු ආදායම් ගිණුමේ දක්වා නොතිබුණි.
  - මුදල් රෙගුලාසි 128(2)(ආ) ප්‍රකාරව රජයට ලැබිය යුතු ගාස්තු අප්‍රමාදව හා සම්පූර්ණයෙන්ම එකතු කර ගැනිමට දෙපාර්තමේන්තුව නටයුතු නොකළ අවස්ථා අනාවරණය වී තිබුණි.
  - හිග ගාස්තු අයකර ගැනීම සම්බන්ධයෙන් එම කාර්යය පැවැරි ඇති නිලධාරින් විසින් මුදල් රෙගුලාසි 128(1)(ඌ) හා 128(2)(ඉ) විධිවිධානයන් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

- ලියාපදිංචි ගාස්තු ආදායම් සම්බන්ධයෙන්, නිසි ලෙස වාර්තාගත නොවිමත්, වාර්තාගත වු තොරතුරු නිසි පරිදි ලේඛනගත කර නොතිබිමත් පිළිබඳ පහත සඳහන් අවස්ථාවන් විගණනයේදි නිරීක්ෂණය විය.

  - 2012 දෙසැම්බර් 31 දිනැති අංක 9/2012 දරන රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ චක්‍රලේඛය ප්‍රකාරව විවාහ, උපත් ,මරණ සහතික පිටපත් නිකුත් කිරීම, ප්‍රකාශ පත්‍ර සහ පරිවර්තන වෙනුවෙන් වූ අයකිරිම් පිළිබඳව සහ විවාහ ලියාපදිංචි කිරිම් වෙනුවෙන් අයකරන ගාස්තු පිළිබඳව වර්ගීකරණ සාරාංශ වාර්තාවක් මාසිකව පිළියෙල කර ඊළග මාසයේ 05 දිනට ප්‍රථම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරි වෙත යොමු කළ යුතු වුවත්, 2013 ජනවාරි මාසයේ සිට ජුනි මාසය දක්වා කාලය සඳහා ප්‍රාදේශිය ලේකම් කාර්යාල 98 ක් ඒ අනුව කටයුතු කර නොතිබුණි.
  - උක්ත චක්‍රලේඛය ප්‍රකාරව ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල විසින් සහ කලාප කාර්යාල විසින් ප්‍රධාන කාර්යාලය වෙත යොමු කරන ලද ලියාපදිංචි ගාස්තු බැංකු පත්‍රිකා (slip) ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල අනුව සහ කලාප

කාර්යාල අනුව 2013 ජුනි මාසයෙන් පසු නිසි ලෙස වර්ග කර ගොනුගත කර නොතිබුණි.

**(ඊ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විෂය අංක 25401 දරන අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.2,005,820 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත්වී තිබුණි

(ii) ස්ථාන මාරුවීම් ලබා ගිය, විශ්‍රාම ගිය, මිය ගිය, සේවයෙන් පහ කළ, සේවයෙන් ඉල්ලා අස්වී ගිය හා සේවය හැර ගිය නිලධාරීන් 198 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.1,772,281 ක් වූ ණය ශේෂ අය කර ගැනිමට කටයුතු කර නොතිබුණි.

## 3.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 3.4.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2013 ජනවාරි 30 දින පිළියෙල කර තිබුණි.

### 3.4.2 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම

දෙපාර්තමේන්තුමය වශයෙන් විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කර නොතිබුණි.

## 3.5 වත්කම් කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

**(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** 2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මඟින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර 2013 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2014 මාර්තු 15 දිනට ප්‍රථම සිදුකර එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, දෙපාර්තමේන්තුව

විසින් එම වාර්තා 2014 මැයි 31 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**(ii)** 2013 වර්ෂයට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි.

**(ආ) ජංගම නොවන සංචලන වාර්තාවේ වාහන අඩුවෙන් දැක්වීම**

ස්ථාවර වත්කම් ලේඛනය අනුව දෙපාර්තමේන්තුව සතුව වාහන 14 ක් පැවති නමුත් ජංගම නොවන වත්කම් සංචලන වාර්තාවේ වාහන 08 ක් පමණක් සදහන් කර තිබුණි.

**(ඇ) බේරුම් නොකළ බැරකම්**

දෙපාර්තමේන්තුව විසින් 2013 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ වර්ෂයකට අඩු කාලයක සිට පැවැත එන බැරකම්වල එකතුව රු.38,535,069 ක් වී තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඉහත ශේෂයන් පියවා දැමීමේ තත්ත්වයන් අසතුටුදායක විය.

(ii) මුදල් රෙගුලාසි 94(1) විධිවිධාන වලට පටහැනිව වැය විෂයයන් 04 ක් සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරිය ඉක්මවා රු.3,393,295 ක බැරකම්වලට එළඹ තිබුණි.

(iii) ඡායා පිටපත් සේවාව ලබාගැනිම සඳහා 2013 වර්ෂ අවසානවන විටදී රු15,808,163 ක බැරකම්වලට එළඹ තිබුණි. නියමිත පරිදි ඡායා පිටපත් සේවාව සඳහා ප්‍රතිපාදන සළසා නොගැනීම නිසා වාර්ෂිකව බැරකම්වලට එළඹීමත්, ඊළඟ වර්ෂයේ ප්‍රතිපාදනවලින් එම බැරකම් පියවීමත් අඛණ්ඩව සිදු කර තිබුණි.

## 3.6 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) **ව්‍යවස්ථාපිත විධිවිධාන** | | |
| නොතාරිස් ආඥා පනතේ 31(26) වගන්තිය | - | බොහෝ නොතාරිස්වරුන් තමා සාක්ෂි දැරූ සියළුම ඔප්පුවල දෙවන පිටපත් ඊළග මාසයේ 15 දිනට ප්‍රථම දෙපාර්තමේන්තුව වෙත භාර දී නොතිබුණු අවස්ථා නිරීක්ෂණය විය. |
| (ඇ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) මුදල් රෙගුලාසි 188(2) | 77,850 | (i) 2013 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශයේ සදහන්ව තිබුණු මුදල් පොතට හර නොවූ බැංකු ගිණුමට බැර වී තිබුණු එකතුව රු.77,850 ක් 2014 මැයි මාසය වන විටත් ගිණුම්ගත කර නොතිබුණි. |
| | 29,891,284 | (ii) 2013 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශයේ දක්වා තිබුණු වැරදීමකින් මුදල් පොතේ දෙවරක් සටහන් කර තිබුණු රු.29,891,284 ක් 2014 මැයි මාසය වන විටත් නිවැරදි කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 396(ඈ) | 283,072 | නිකුත් කළ නමුත් ගෙවීම් සදහා ඉදිරිපත් නොවූ මාස 6 ක කල් ඉකුත් වූ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

**3.7 කාර්යසාධනය**

----------------

2013 වාර්ෂික අයවැය ඇස්තමේන්තු අනුව රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්**

---------------------------------------------

දෙපාර්තමේන්තුව සිය අරමුණුවලට අදාල කාර්යවලින් බැහැරව ක්‍රියා කළ අවස්ථා නිරික්ෂණය වූ අතර, නියැදි පරික්ෂණවලදී එසේ අනාවරණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) ලේඛන සංරක්ෂණය කිරීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්ය භාරයක් වන නමුත් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ කටයුතු සඳහා අවශ්‍ය වන ඡායා පිටපත් සේවය පෞද්ගලික අංශයට පවරා තිබීම නිසා ලේඛන සංරක්ෂණය කිරීමේ කටයුත්තට බාධාකාරී වී තිබුණි. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්ය කෙරෙහි ඇතිවන බලපෑම අවම කිරීම උදෙසා පෞද්ගලික අංශයට පවරා ඇති ඡායා පිටපත් සේවය සඳහා වන ගිවිසුමේ වගන්ති ඇතුළත් කර යම් කිසි ආරක්ෂණයක් හෝ සළසා ගැනිමට පියවර ගෙන නොතිබුණි.

(ii) ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය වෙත ලැබී තිබූ ඔප්පුවල දෙවන පිටපත්, පැවැරුම්කර, බදු ඔප්පු ගිවිසුම්පත් ආදිය ඒ ඒ නොතාරිස්වරයා නමින් වෙළුම්ගත කර සංරක්ෂණය කළ යුතු වුවත්, 2005 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා තාවකාලික ගොණුද පවතින බවත් 2011 වර්ෂයේ සිට ඔප්පු වර්ගීකරණය කර වෙළුම්ගත කිරිමටද කටයුතු කර නොතිබුණි.

**3.8 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

----------------------------------------

**බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීමේ දීර්ඝ ප්‍රමාදයන්**

------------------------------------------------------------

දෙපාර්තමේන්තුවේ බැංකු ගිණුමකට අදාලව 2013 ජුලි මාසයේ සිට 2013 නොවැම්බර් මාසය දක්වා වූ බැංකු සැසඳුම් ප්‍රකාශ 2013 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

**3.9 අවිධිමත් ගනුදෙනු**

----------------------

දෙපාර්තමේන්තුව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථාවක් පහත දැක්වේ.

**රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම**

ජායා පිටපත් සේවාව පෞද්ගලික අංශයට ලබා දීම සඳහා වූ ප්‍රසම්පාදනය සඳහා ලංසු කැඳවීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.2 මාර්ගෝපදේශය අනුව ලංසු කැඳවීමේ ආරාධනයෙහි ප්‍රසම්පාදනයට අදාලව ලංසුකරුට තිබිය යුතු විදුලි බලය සපයා ගැනීම සහ ආපසු ගෙවන තැන්පතුව පිළිබඳ මූලික කරුණු ප්‍රසම්පාදන දැන්වීමේහි පළකර නොතිබුණි.

## 3.10 කළමනාකරණ දුර්වලතා

දෙපාර්තමේන්තුවේ ගනුදෙනු සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යේලයේ මුද්දර ආදායම් වාර්තාවලට අනුව සියලුම ප්‍රාදේශිය ලේකම් කාර්යාල වල රෙජිස්ට්‍රාර් ජනරාල් අංශ ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණද දිස්ත්‍රික්ක 03 ක් කාර්යාල 4 ක් පිහිටුවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) විධිහිනතා නිවැරදිව වාර්තා කරගෙන නිවැරදි කාලසීමාව තුළ විධිහිනතා දැනුම් දී ඒ අනුව දඩ මුදල් ගණනය කර අයකර ගැනීමට හෝ වෙනත් දඬුවම් ක්‍රියාමාර්ගයන් ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) නොතාරිස්වරුන් විසින් නිකුත් කරනු ලබන සමහර ඔප්පුවල දෙවන පිටපත් හා හිස් වාර්තා විධිමත් පරිදි ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල වෙත නියමිත දිනවල භාර නොදීම නිසා ඒ සඳහා අයකරනු ලබන මුද්දර ආදායම් නියමිත කාලවකවානු තුළ ලැබී නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 3.11 මානව සම්පත් කළමනාකරණය

**(අ) අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 43 | 10 | 33 |
| (ii) | තෘතියික මට්ටම | 47 | 45 | 02 |
| (iii) | ද්විතියික මට්ටම | 2,108 | 1,609 | 499 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 464 | 387 | 77 |
| | **එකතුව** | **2,662** | **2,051** | **611** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 622 ක් පිරවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

**(ආ) අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ට නිදහස් කළ මානව සම්පත්**

දෙපාර්තමේන්තුව විසින් වෙනත් පාර්ශවයන්ට 2013 දෙසැම්බර් 31 දින වන විට අවිධිමත් ලෙස මුදාහැර තිබුණු මානව සම්පත් පිළිබඳ විස්තරයක් පහත දැක්වේ.

| සේවක වර්ගය | සංඛ්‍යාව | වෙනත් පාර්ශවය | මුදාහැර තිබුණු දිනය |
|---|---|---|---|
| අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් | 01 | ජනාධිපති ලේකම් කාර්යාලය | 2010 පෙබරවාරි 16 දින |
| අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් | 01 | පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය | 2010 දෙසැම්බර් 31 දින |